**ගම්පහ, අත්තනගල්ල සහ මිනුවන්ගොඩ සම්බන්ධ කිරීමේ ජල සම්පාදන ව්‍යාපෘතිය - 2015**

-----------------------------------------------------------------------------------------------------------

ගම්පහ, අත්තනගල්ල සහ මිනුවන්ගොඩ සම්බන්ධ කිරීමේ ජල සම්පාදන ව්‍යාපෘතියේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

**1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය**

-----------------------------------------------------------------------------------

එවකට, ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍යාංශය වර්තමානයේ නගර සැලසුම් සහ ජල සම්පාදන අමාත්‍යාංශය මගින් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ වගකීම දරන අතර ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය මගින් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ වගකීම දරනු ලැබේ. ගම්පහ, අත්තනගල්ල සහ මිනුවන්ගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට අයත් ප්‍රදේශ සහ මීරිගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් ප්‍රදේශයේ ස්ථාන කිහිපයක ද නිවැසියන් සඳහා ආරක්ෂිත සහ විශ්වාසදායක පානීය ජලය සැපයීම ව්‍යාපෘතියේ අරමුණ වේ. ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මිලියන 33,060 කට සමාන එජඩො මිලියන 229.50 ක් වන අතර, ඉන් රු.මිලියන 28,100 කට සමාන එජඩො මිලියන 195.07 ක් චීන සංවර්ධන බැංකු සංස්ථාව මඟින් මූල්‍යායනය කිරීමට එකඟ වී තිබූ අතර ඉතිරි රු.මිලියන 4,960 කට සමාන එජඩො මිලියන 34.43 ක් ලංකා බැංකුව මඟින් ද මූල්‍යායනය කිරීමට එකඟ වී තිබුණි. කෙසේවෙතත්, සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් මේ පිළිබඳ ණය ගිවිසුම් අත්සන් කර නොතිබුණි. ව්‍යාපෘතිය 2014 වර්ෂයේදී ආරම්භ කර 2017 වර්ෂයේදී නිම කිරීමට අපේක්ෂා කර තිබුණද, 2017 පෙබරවාරි 20 දින ව්‍යාපෘතිය එහි කටයුතු ආරම්භ කර තිබූ අතර 2020 පෙබරවාරි 19 වන විට නිම කිරීමට නියමිතව තිබුණි. කෙසේවෙතත්, 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කර විගණනයට ඉදිරිපත් කර තිබුණි.

**1.3 <u>මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම</u>**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමණාකරණයේ වගකීම වේ.

**1.4 <u>විගණකගේ වගකීම</u>**

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි. මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළ වන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරුකිරීම් ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරුකිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි. පහත සඳහන් දෑ තක්සේරු කිරීම පිණිස අවශ්‍ය යැයි සලකනු ලැබූ පරීක්ෂා කිරීම් ද එම පරීක්ෂණයට ඇතුළත් විය.

(අ) අභ්‍යන්තර පාලන අංශයෙන් බලන කළ ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ සතුටුදායක පාලනයක් සහ ව්‍යාපෘතියේ මෙහෙයුම්වලට අදාළ පොත්පත්, වාර්තා ආදියෙහි විශ්වාසන්තභාවය තහවුරු වනු පිණිස පද්ධති හා පාලන ප්‍රමාණවත් වුයේද යන බව,

(ආ) ව්‍යාපෘතිය විසින් පවත්වාගෙන යනු ලබන මූල්‍ය වාර්තා හා ප්‍රගති වාර්තා සමඟ ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති වියදම් සතුටුදායක ලෙස සංසන්දනය කර තිබුණේ ද යන බව,

(ඇ) ව්‍යාපෘතියේ වියදම් දැක්වෙන පරිදි අඛණ්ඩ පදනමක් මත ප්‍රමාණවත් ගිණුම් වාර්තා පවත්වා ගනු ලැබුවේද යන බව,

(ඈ) ණය යටතේ සපයන ලද අරමුදල්, ද්‍රව්‍ය සහ උපකරණ, ව්‍යාපෘතියේ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණේද යන බව.

(ඉ) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා යොදා ගන්නා ලද වර්ගීකරණයට අනුව වියදම් නිවැරදි ලෙස හඳුනාගෙන තිබුණේද යන බව,

(ඊ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති පදනම් කරගෙන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබුණේද යන බව,

## 2. <u>මූල්‍ය ප්‍රකාශන</u>

### 2.1 <u>මතය</u>

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිළි කිරීම් අනුව, 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතිය නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව සහ ව්‍යාපෘතියේ ක්‍රියාකාරිත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව 2015 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව, මා දරන්නා වූ මතය වේ.

### 2.2 <u>මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම</u>

#### 2.2.1 <u>මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම</u>

මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශයේ අංක එම්ඕඑෆ්පී/ඊආර්ඩී/2007/02 දරන 2007 අගෝස්තු 07 දිනැති චක්‍රලේඛයට අනුව, 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, 2016 මාර්තු 31 දින හෝ ඊට පෙර විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කළ යුතුයි. කෙසේවෙතත්, ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කර තිබුණේ 2017 ජූනි 27 වන දිනදීය.

#### 2.2.2 <u>නොසැසඳු ශේෂ</u>

සමාලෝචිත වර්ෂය තුළදී ශ්‍රී ලංකා රජයෙන් ලැබුණු එකතුව රු. මිලියන 26.89 ක් වූ දායක මුදල්, ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් පවත්වා ගෙන යනු ලබන වාර්තාවල දක්වා ඇති ඊට අනුරූපී මුදල වන රු. මිලියන 24.49 සමග නොසැසඳුණි.

#### 2.2.3 නීති, රීති හා රෙගුලාසි වලට අනුකූල නොවීම

-----------------------------------------------

අංක 842 දරන හා 1978 දෙසැම්බර් 19 දිනැති භාණ්ඩාගාර චක්‍රලේඛයේ විධිවිධාන අනුව, ව්‍යාපෘතිය සඳහා ස්ථාවර වත්කම් ලේඛනයක් විධිමත් පරිදි පවත්වා නොතිබුණි. තවද, කොන්ත්‍රාත් ගිවිසුමේ 2.12 ඡේදයට අනුව, පරිගණකගත කරන ලද නඩත්තු පද්ධතියක් සහ පරිගණකගත කරන ලද වත්කම් ලේඛනයක් කොන්ත්‍රාත්කරු විසින් සැපයිය යුතුයි. කෙසේවෙතත්, ව්‍යාපෘතිය විසින් එබඳු පද්ධතියක් භාවිත කර නොමැති අතර ලේඛනයක් ද පවත්වා නොතිබුණි.

## 3. මූල්‍ය හා භෞතික කාර්යසාධනය

### 3.1 අරමුදල් උපයෝජනය

සපයන ලද තොරතුරු අනුව, ව්‍යාපෘතියේ කටයුතු ක්‍රියාත්මක කිරීම සඳහා 2015 වර්ෂයේදී රේඛීය අමාත්‍යාංශයේ අයවැය ඇස්තමේන්තුවේ දේශීය මූල්‍යයන ප්‍රභව තුළින් රු. මිලියන 24.50 ක් වෙන් කර තිබුණි. මූල්‍ය ප්‍රකාශනවලට අනුව, වෙන් කරන ලද ඉහත සඳහන් ප්‍රතිපාදනවලින්, සමාලෝචිත වර්ෂය අවසානයට රු. මිලියන 19 ක් පමණක් උපයෝජනය කර තිබුණි. තවද, ව්‍යාපෘතියේ අරමුණු ඉටු කර ගැනීම සඳහා මූල්‍ය සහ භෞතික ඉලක්ක සඳහන් කරමින් සම්පූර්ණ විස්තරාත්මක ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙළ කර ක්‍රියාත්මක කර නොතිබුණ අතර ඒ සඳහා මූල්‍ය ප්‍රතිපාදන ද වෙන් කර නොතිබුණි.

### 3.2 භෞතික ප්‍රගතිය.

සපයන ලද තොරතුරු අනුව, ඉදිකිරීම් කටයුතු ක්‍රියාත්මක කිරීම සඳහා අනවශ්‍ය සංවර්ධන යෝජනාවක් මගින් තෝරාගත් විදේශීය කොන්ත්‍රාත්කරුවකු සමග 2013 මැයි 15 දින ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් කොන්ත්‍රාත් ගිවිසුමකට එළඹ තිබුණි. කෙසේවෙතත්, ඒ සඳහා මූල්‍යමය ප්‍රතිපාදන සලසා නොමැති හෙයින් එම ගිවිසුම කාර්යක්ෂම ලෙස ක්‍රියාත්මක කිරීම හෝ ඉදි කිරීම් කටයුතු ආරම්භ කර හෝ නොතිබුණි.

### 3.3 මූල්‍ය පාලනය පිළිබඳ ගැටළු

මූල්‍ය රෙගුලාසි 133 ප්‍රකාරව, 2017 දෙසැම්බර් 31 වන විටත් ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ අභ්‍යන්තර විගණන අංශය මගින් ව්‍යාපෘතියේ ගනුදෙනු විගණනයට ලක්කර නොතිබුණි.